රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක: 21/95 (i)

මගේ අංකය: IV/2/3/9/40 (එච්) 95
ආයතන අංශය
රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, වැවිලි කර්මාන්ත
හා පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යාංශය ,
නිදහස් චතුරශ්‍රය ,
කොළඹ 07
1995.10.26

සියලුම අමාත්‍යාංශ ලේකම්වරුන්,
ප්‍රධාන ලේකම්වරුන්,
ආණ්ඩුකාර ලේකම්වරුන්, දෙපාර්තමේන්තු ප්‍රධානීන්,
සංස්ථා සභාපතිවරුන්, නිසි බලධාරීන්.,

**කාර්යාල දිනයන්හි (බදාදා) නිලධාරීන්**
**<u>සාකච්ඡා ආදිය සඳහා කැඳවීම</u>**

1995.06.19 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 21/95 ට ඔබේ අවධානය යොමු කරවමි.

02. එම චක්‍රලේඛය අනුව බදාදා දිනවල සියළු නිලධාරීන් කාර්යාලවල රැඳී සිටිය යුතු යයි දන්වා ඇති නමුත් එම උපදෙස් නොතකමින් සාමාන්‍ය සාකච්ඡා සහ සම්මන්ත්‍රණ සඳහා ද නිලධාරීන් කැඳවීම දිගටම සිදු කෙරෙන බව ජනාධිපති ලේකම් විසින් මගේ අවධානයට යොමු කර ඇත.

03. එබැවින් කාර්යාල දිනවල නිලධාරීන් හමු වී සිය කටයුතු ඉටු කර ගැනීම සඳහා ඉතා දුර බැහැර ප්‍රදේශවල සිට පැමිණෙන මහජනතාවට නිලධාරීන් හමුවිය නොහැකිවීම නිසා මහත් දුෂ්කරතාවයනට මුහුණපෑමට සිදුව ඇති බව යලිත් වරක් අවධාරණයෙන් දන්වා සිටිමි.

04. ගංවතුර හෝ වෙනත් විපත් සඳහා හදිසි සහන සැලසීම වැනි කල් දැමිය නොහැකි කාර්යයන් සඳහා හැර බදාදා දිනවල කාර්යාලවලින් බැහැර රාජකාරි කටයුතු සඳහා නිලධාරීන් නොකැඳවිය යුතු බව මෙයින් දන්වමි.

අ.කලේ/(**ආර්.එස්.ජයරත්න**)
ලේකම්
රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු,වැවිලි කර්මාන්ත
හා පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යාංශය